සැ. යු.- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,676 - 2010 ඔක්තෝබර් මස 15 වැනි සිකුරාදා - 2010.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1626 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත ගෙවල් කුලී ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මව ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අමාත්‍ය ආර්. එම්. කුමාරසිරි රත්නායක,
මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන,
පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ
ආහාර සැපයීම් සහ බෙදාහැරීම්
අමාත්‍යාංශය,
ඌව පළාතේ පළාත් සභාව.

2010 සැප්තැම්බර් මස 28 වැනි දින,
බදුල්ල,
ආර්. එච්. ගුණවර්ධන මාවත, අංක 301 හි
අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත ගෙවල් කුලී ප්‍රඥප්ති කෙටුම්පත**

***ඌව පළාතේ ජීවත් වන කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා ද, පදිංචිය සඳහා ඔවුන්ට අවශ්‍ය වන්නාවූ පහසුකම් සැලසීම හා ඔවුන්ගේ සුභ සිද්ධිය සලසාදීම සඳහා ද, එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන්නා වූ නීතිමය ප්‍රතිපාදන සැලසීම සහ නීත්‍යානුකූල බලය සහිත ආයතන හා සංවිධාන සංස්ථාපනය කර පවත්වාගෙන යාම සඳහා ද එයට ආනුෂාංගික වූ කරුණු ඉටුකරලීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද පනවනු ලබන ප්‍රඥප්තියකි.***

මෙම ප්‍රඥප්තිය 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත හා එයට පසුව කරන ලද සංශෝධන පනත්වලට ද අනුකූල වන්නේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් ගෙවල් කුලී ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට හෝ නියම කරන පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වන්නේය.

පනත් අදාල කර ගැනීම

2. මෙහි මින් මතු "අදාළ පනත්" යනුවෙන් සඳහන් කරනු ලබන 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත හා ඊට අදාළ සංශෝධන පනත්වල සඳහන් කාර්ය හා කර්තව්‍ය ඌව පළාත තුළ ඉටු කිරීම පිණිසත් එහි සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම පිණිසත් මෙහි මතු සඳහන් පරිදි වගකීම් පවරා දීම නීත්‍යානුකූල වන්නේය.

ඌව පළාත

3. මෙහි මින් මතු "පළාත" යනුවෙන් හඳුන්වනු ලබන බදුල්ල හා මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් ආවරණය වන ප්‍රදේශය ඌව පළාත ලෙස හඳුන්වනු ලැබේ.

පළාත් සභාව

4. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වැනි සංශෝධනය ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනත අනුව ඌව පළාත සඳහා පිහිටුවා ගන්නා ලද තත්කාලයෙහි ක්‍රියාත්මක වන්නා වූ ව්‍යවස්ථාපිත දේශපාලන අධිකාරිය ඌව පළාත් සභාව ලෙස හඳුන්වනු ලබන අතර, අදාළ පනත්වල පාර්ලිමේන්තුව යනුවෙන් සඳහන් කර එයට, පවරා ඇති සියලු වගකීම් එම පනත් මෙම පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභාව විසින් ඉටුකරනු ලැබිය යුතුය.

(2) අදාළ පනත්වල නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ලෙස සඳහන් කර එය වෙත පවරා ඇති සියලු වගකීම් එම පනත් මෙම පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

පළාත් අමාත්‍යවරයා

5. (1) ඌව පළාත් සභාවේ නිවාස විෂයය භාර අමාත්‍යවරයා මෙහි පළාත් අමාත්‍යවරයා ලෙස හඳුන්වනු ලබන අතර අදාළ පනත්වල, "අමාත්‍යවරයා" ලෙස සඳහන් කර ඔහු වෙත පවරා ඇති සියලු කාර්ය හා කර්තව්‍ය පළාත තුළ ඉටු කිරීම ද, බලතල ක්‍රියාත්මක කිරීම ද පළාත් අමාත්‍යවරයා විසින් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) අදාළ පනත්වල අමාත්‍යවරයා විසින් සාදනු ලැබ තත්කාලයෙහි බලපවත්නා නියෝග පළාත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ලෙස සැලකිය යුතු අතර, අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත් යටතේ අමාත්‍යවරයා විසින් පනවා ඇති නියෝග අනුව ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතුය. එසේම තත්කාලයෙහි බල පවත්නා අවලංගු කිරීමට, වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ නව නියෝග සෑදීමට පළාත් අමාත්‍යවරයාට හැකි විය යුතුය.

පළාත් නිවාස දෙපාර්තමේන්තුව පිහිටුවීම

6. අදාළ පනත්වල සඳහන් කාර්ය හා කර්තව්‍යය ඌව පළාත තුළ ඉටු කිරීම සඳහා පළාත් නිවාස දෙපාර්තමේන්තුවක් සංස්ථාපනය කළ යුතුය. එම දෙපාර්තමේන්තුව ඌව පළාත් නිවාස විෂයය භාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙනම ඒකකයක් හෝ අංශයක් ලෙස පැවතිය යුතුය.

7. අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එකී පනත්වල "ජාතික නිවාස දෙපාර්තමේන්තුව" ලෙස සඳහන් කර එය වෙත පවරා ඇති සියලු කාර්යය හා කර්තව්‍ය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් පමණට පළාත තුළ ඉටු කිරීම ද, වගකීම් දැරීම ද ඉහත 6 වැනි ඡේදයේ සඳහන් පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේය.

පළාත් නිවාස කොමසාරිස්

8. (1) ඉහත 6 වැනි ඡේදයේ සඳහන් පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් නිවාස කොමසාරිස්වරයෙකු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විය යුතුය.

(2) අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල "ජාතික නිවාස කොමසාරිස්වරයා" හෝ "කොමසාරිස්වරයා" ලෙස සඳහන් කර ඔහු වෙත පවරා ඇති සියලු කාර්යය හා කර්තව්‍ය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් පමණට ඌව පළාත තුළ ඉටු කිරීම ද එකී පනත්වලින් ඔහු වෙත පවරා ඇති බලතල ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීම ද පළාත් නිවාස කොමසාරිස්වරයා විසින් සිදුකළ යුතු අතර එසේ සිදු කිරීම නීත්‍යානුකූල වන්නේය.

පළාත් නිවාස ගිණුම

9. අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල "ජාතික නිවාස අරමුදල" හෝ "අලුත්වැඩියා අරමුදල" ලෙස සඳහන් කර එම අරමුදල වෙත පවරා ඇති සියලු කාර්යයන් පළාත තුළ ඉටු කිරීම සඳහා ''පළාත් නිවාස ගිණුම" ලෙස හඳුන්වනු ලබන අරමුදලක් ඇති කළ යුතු අතර, අදාළ පනත්වල ජාතික නිවාස අරමුදල මගින් ඉටු කරනු ලබන සියලු කාර්යයන් ඌව පළාත තුළ ඌව පළාත් නිවාස ගිණුම මගින් ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේය.

ප්‍රාදේශීය සභාව ඇතුළත් කිරීම

10. (1) අදාළ පනත්වල "ප්‍රාදේශීය බල මණ්ඩල" යනුවෙන් හඳුන්වා ඇති සියලු තැන්හි දී තත්කාලයේ ක්‍රියාත්මක ප්‍රාදේශීය සභාවන් ද ඇතුළත් විය යුතු අතර එම පනත්වල සුළු නගර සභා හා ගම් සභා ලෙස සඳහන් කර ඇති සියලු තැන්වලට "ප්‍රාදේශීය සභා" ආදේශ කරමින් අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) අදාළ පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල සුළු නගර සභා හා ගම් සභා ලෙස සඳහන් කරමින් එම ආයතන වෙත පවරා ඇති සියලු බලතල, කාර්යය හා කර්තව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා එම වගකීම් දැරීම නීත්‍යානුකූල වන්නේය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

11. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

10-560/1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ යෝජිත නිවාස සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මව ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

අමාත්‍ය ආර්. එම්. කුමාරසිරි රත්නායක,<br>
මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන,<br>
පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ<br>
ආහාර සැපයීම් සහ බෙදාහැරීම්<br>
අමාත්‍යාංශය,<br>
ඌව පළාතේ පළාත් සභාව.

2010 සැප්තැම්බර් මස 28 වැනි දින,<br>
බදුල්ල,<br>
ආර්. එච්. ගුණවර්ධන මාවත, අංක 301 හි,<br>
අමාත්‍ය කාර්යාලයේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව

*ඌව පළාතේ යෝජිත නිවාස සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වැනි සංශෝධනයේ නව වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව ඌව පළාත තුළ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීම, ඔවුන්ට ද්‍රව්‍ය ආධාර, ණය හෝ මූල්‍ය ආධාර ලබාදීම, ඉඩම් හෝ ඉදිකරන ලද නිවාස ලබා දීම ද ඇතුළුව නිවාස පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය කිරීම, ප්‍රගති පාලනය කිරීම ද එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම හා ඒ සඳහා වෙන්කර ඇති මුදල් කළමනාකරණය කිරීම ද, නිවාස සංවර්ධන අරමුණ ඇතිව ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රජා සංවිධාන ස්ථාපනය කිරීම සහ එම සංවිධානවලට බලතල පැවරීම සඳහා ද , නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි.*

මෙම ප්‍රඥප්තිය 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතට අනනුකූල වේ.

පූර්විකාව

ඌව පළාත්වාසී සියලුදෙනාහට පදිංචියට සුදුසු නිවසක් සපයාදීම හෝ ලබාගැනීමට හෝ ඉදිකර ගැනීමට අවශ්‍ය අධාර ලබා දීම තුළින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම ඌව පළාත් සභාවේ ප්‍රතිපත්තිය වන හෙයින් ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් නිවාස සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙහි මින් මතු "ආණ්ඩුකාරවරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දිනක සිට හෝ ආණ්ඩුකාරවරයා විසින් නියම කරන දිනක සිට ක්‍රියාත්මක වේ.

### *I වැනි කොටස*

*සාමාන්‍ය*

අරමුණ

2. ඌව පළාත තුළ වාසය කරන ජනතාවට පදිංචිය සඳහා සුදුසු නිවාස ලබාගැනීමට හෝ ඉදිකර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලැසීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම මෙම ප්‍රඥප්තියේ අරමුණ විය යුතුය.

නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුව

3. ඉහත 2 වැනි වගන්තියේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ මෙම ප්‍රඥප්තියේ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම පිණිස ඌව පළාත සඳහා නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවක් (මෙහි මින් මතු "දෙපාර්තමේන්තුව" ලෙස හඳුන්වනු ලබන) පැවතිය යුතු අතර එය වෙනම දෙපාර්තමේන්තුවක් හෝ ඒකකයක් ලෙස සංවිධානය කළ යුත්තේය.

4. ඉහත 3 වගන්තියේ සඳහන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් නිවාස කොමසාරිස්වරයෙකු (මෙහි මින් මතු "කොමසාරිස්" වශයෙන් හඳුන්වනු ලබන) ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විය යුතුය. පළාත් නිවාස කොමසාරිස්

5. පළාත් නිවාස කොමසාරිස්වරයාට සහයවනු පිණිස සහකාර කොමසාරිස්වරුන් හෝ සෙසු නිලධාරීන් පත්කළ හැකිය. සෙසු නිලධාරීන් පත් කිරීම

6. පළාත් නිවාස කොමසාරිස්වරයා ඌව පළාත් නිවාස විෂය භාර අමාත්‍යාංශයේ (මෙහි මින් මතු "අමාත්‍යවරයා" ලෙස හඳුන්වනු ලබන) අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධානයන්ට හා ඌව පළාත් නිවාස විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ (මෙහි මින් මතු "ලේකම්වරයා" ලෙස හඳුන්වනු ලබන) විධානයන්ට හා අධීක්ෂණයට යටත්ව ක්‍රියා කළ යුතුය.

## II වැනි කොටස

### *බලතල හා කාර්යයන්*

7. අමාත්‍යවරයා හා ලේකම්වරයාගේ විධානයන්ට යටත්ව පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම නිවාස කොමසාරිස්වරයාගේ වගකීම වන්නේය :- නිවාස කොමසාරිස්වරයාගේ කාර්ය හා කර්තව්‍යයන්

(1) අඩු ආදායම්ලාභීන් සඳහා සහ මහජන ආධාර ලබන්නන් සඳහා නිවාස ආධාර ලෙස ද්‍රව්‍ය හෝ මුදල් ලබාදීමේ ව්‍යාපෘති සංවිධානය කිරීම ;

(2) අඩු ආදායම්ලාභීන් වෙත නිවාස සංවර්ධනය සඳහා ණය මුදල් ලබාදීම ;

(3) ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති සංවිධානය කිරීම;

(4) නිවාස සංවර්ධනය උදෙසා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම ;

(5) නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් යටිතල පහසුකම් සැලසීම ;

(6) මහජන අයිතියට පවරා ඇති නිවාස ව්‍යාපෘතිවලට තවදුරටත් අවශ්‍ය වන පහසුකම් සැලසීම ;

(7) නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම. එම ඉඩම් සංවර්ධන කිරීම, එම ඉඩම්වල නිවාස ඉදිකිරීම ;

(8) නිවාසලාභීන් හෝ ඉඩම්ලාභීන් හඳුනාගැනීම, තෝරාගැනීම, ඔවුන් සඳහා නිවාස හෝ ඉඩම් පවරා දීම ;

(9) නිවාස ඉදිකර ගැනීම සඳහා සුදුසු ඉඩම් නොමැති අය හට යෝග්‍ය ඉඩම් ලබාදීම ;

(10) ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් ලබාදීම සඳහා සුදුසු ක්‍රමවේදයන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සකස් කිරීම ;

(11) ණය මුදල් හෝ දේපළ වටිනාකම් ආපසු අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සකස් කිරීම ;

(12) නිවාස සංවර්ධන අරමුණු වෙනුවෙන් විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් අමාත්‍යවරයාගේ හා ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව සුදුසු ව්‍යාපෘති සඳහා යෙදවීම ;

(13) නිවාස සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පරිපාලනය, කළමනාකරණය, අධීක්ෂණය හා පසු විපරම් කිරීම ;

(14) නිවාස සංවර්ධන කාර්යයන් උදෙසා ප්‍රජා සංවිධාන ස්ථාපනය කිරීම සඳහා සුදුසු කටයුතු කිරීම හා එවැනි සංවිධාන ලියාපදිංචි කිරීම ;

(15) නිවාස සංවර්ධන කාර්යයන් හා සම්බන්ධව වෙනත් ආයතන හා සංවිධාන සමඟ නිවාස සංවර්ධන අරමුණු සහිත කාර්යයන් සඳහා ලේකම්වරයා වෙනුවෙන් ලිඛිත ගිවිසුම් ඇති කර ගැනීම සඳහා නිල ලියකියවිලිවලට අත්සන් තැබීම සහ එවැනි ආයතන හා සංවිධාන සමග එක්ව කටයුතු කිරීම ;

(16) මෙම ප්‍රඥප්තියේ කටයුතු සඳහා දේශීය වශයෙන් අරමුදල් සැපයෙන මාර්ගවලින් මුදල් ණයට ගැනීම සඳහා නිවාසලාභීන්ට පහසුකම් සැලසීම ;

(17) මෙම ප්‍රඥප්තියේ ප්‍රකාර ලබාදෙන ගොඩනැගිලි සඳහා කුලිය, බදු කුලිය හෝ ගාස්තු අය කිරීම හා භාරගැනීම.

අමාත්‍යවරයා සතු බලතල

8. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යවරයාට පහත සඳහන් බලතල තිබිය යුතුය :-

(1) නිවාස සංවර්ධන අරමුණු සහිත වූ චංචල හෝ නිශ්චල දේපළ තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකට භාරගැනීම, සුරක්ෂිත කිරීම, පාලනය කිරීම, විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ නිවාස සංවර්ධන අරමුණු උදෙසා වෙනත් ආකාරයකට බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීම ;

(2) නිවාස ද්‍රව්‍ය ආධාර, මූල්‍ය ආධාර, ණය ආධාර, ඉඩම් හෝ නිවාස ලබාදීමේදී අඩු ආදායම්ලාභීන්ගේ හෝ ප්‍රතිලාභීන්ගේ ආදායම් සීමාව ඇතුළු අනෙකුත් සුදුසුකම් තීරණය කිරීම ;

(3) නිවාස සංවර්ධන අරමුණක් සඳහා වෙන් කරන ලද ඉඩමක් එකී කාරණය සඳහා යොදවා ගැනීම අනුමත කිරීම;

(4) ණය මුදල්, ආධාර මුදල්, ඉඩම්, නිවාස හෝ ද්‍රව්‍ය ආධාර ලබාදීමේ දී මුදල, පොලිය, වාරිකය, ප්‍රමාණය කාලය ආදී අදාල සීමාවන් තීරණය කිරීම ;

(5) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් උදෙසා සුදුසු නියෝග පැනවීම.

ප්‍රතිපාදන සැලැස්වීම

9. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සැලසිය යුතු වන්නේය.

(2) නිවාස සංවර්ධන කාර්යයන් උදෙසා නිවාස සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය විසින් හෝ දෙපාර්තමේන්තුව විසින් හෝ සංවිධානය කරන කටයුතුවලින් උපයන ආදායම් පළාත් සභා ගිණුම් හරහා පළාත් අමාත්‍යාංශය වෙත ලබාදිය යුතුය ;

(3) නිවාස සංවර්ධනය උදෙසා සංවිධානය කරන ලොතරැයි ආදායම්, අමාත්‍යාංශය වෙත ලබා ගත හැකිය ;

(4) නිවාස සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍රවලින් ලැබෙන පරිත්‍යාග අමාත්‍යාංශය වෙත භාරගත හැකිය ;

(5) රාජ්‍ය නොවන සංවිධානවලින් කරනු ලබන ප්‍රදානයන් අමාත්‍යාංශය වෙත භාරගත හැකිය ;

(6) මෙම ප්‍රඥප්තිය ප්‍රකාරව අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරන දේපලවලින් කුලී ගාස්තු හෝ බදු මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන විවිධ ආදායම් අමාත්‍යාංශය වෙත භාරගත හැකිය;

(7) ණය වාරික අය කිරීමෙන් හෝ දේපළ බැහැර කිරීමෙන්, වාරික වශයෙන් හෝ එකවර ලැබෙන ආදායම් අමාත්‍යාංශය වෙත භාරගත හැකිය.

නිවාස සංවර්ධන ගිණුම

10. (1) ඉහත 9 වගන්තිය ප්‍රකාර ලැබෙන විවිධ ආදායම් පළාත් නිවාස සංවර්ධන ගිණුමක (මෙහි මින් මතු "ගිණුම" ලෙස හඳුන්වනු ලබන) එක් රැස් කිරීමට හැකි විය යුතුය.

(2) ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වේ.

(3) මෙම ගිණුම 1987 පළාත් සභා පනතේ අංක 42 පරිච්ඡේදය පරිදි විගණනයට යටත් වේ. ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයාගේ විගණනයට ද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට යටත්විය යුතුය.

(4) මෙම ගිණුම ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණයට යටත්විය යුතුය.

නිවාස සංවර්ධන සමිතිය

11. (1) නිවාස සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන්වලට සහාය ලබා ගැනීම පිණිස ප්‍රජාවගෙන් සමන්විත වූ නිවාස සංවර්ධන සමිති පිහිටුවීම නීත්‍යානුකූල විය යුතුය.

(2) ඉහත (1) උපවගන්තියෙහි සඳහන් සමිති පිහිටුවීම සහ පරිපාලනය කිරීම සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස් කර නියෝගයක් ලෙස අමාත්‍යාවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් බලාත්මක කළ හැකිය.

(3) ඉහත (2) උපවගන්තිය පරිදි ව්‍යවස්ථානුකූලව පිහිටු වූ සමිති කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කර ඒ බව සනාථ කරනු වස් සහතිකයක් නිකුත් කළ හැකිය.

(4) ලියාපදිංචි කරන ලද නිවාස සංවර්ධන සමිතියක් සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව නිවාස සංවර්ධනය අරමුණු කරගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට හැකිවිය යුතු අතර පිරිනැමිය හැකි කොන්ත්‍රාත්තුවේ උපරිම වටිනාකම කලින් කල මහා භාණ්ඩාගාරයේ හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් එවැනි සමිති සඳහා නියම කරනු ලබන සීමාවන්ට යටත් විය යුතුය.

(5) නිවාස සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා කොමසාරිස්වරයාට හෝ ලේකම්වරයාට නිවාස සංවර්ධන සමිතිවල සහාය ලබා ගත හැකිය.

ප්‍රතිලාභීන්ගේ වගකීම්

12. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ඉඩමක්, නිවසක්, ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් හෝ වෙනත් ආධාරයක් ලබා ගන්නා ලද ප්‍රතිලාභීන් කොමසාරිස්වරයා සමඟ තම නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කිරීම සඳහා සුදුසු කොන්දේසි ඇතුලත් ගිවිසුමකට (මෙහි මින් මතු "ගිවිසුම" යනුවෙන් හඳුන්වනු ලබන) ඇතුලත් විය යුතු වන්නේය.

(2) ඉහත (1) උපවගන්තියෙහි සඳහන් ගිවිසුම ප්‍රකාර ක්‍රියා නොකරන ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇති ඉඩම, නිවස, ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් හෝ වෙනත් ආධාර ආපසු අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට කොමසාරිස්වරයාට හැකිවිය යුතුය.

(3) ඉහත (2) උපවගන්තිය ප්‍රකාර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙර ගිවිසුමේ කොන්දේසි කඩකර ඇති බව ප්‍රතිලාභියා වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවීමටත් කොන්දේසි යථාවත් කිරීමට දින 21කට නොඅඩු ප්‍රමාණවත් කාලයක් ලබාදීමටත් කොමසාරිස්වරයා කටයුතු කළ යුතුය.

(4) ඉහත (2) උපවගන්තිය ප්‍රකාර ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ දී ගිවිසුමේ සඳහන් දේපළෙහි හෝ ද්‍රව්‍යයෙහි හෝ මුදලෙහි හෝ වටිනාකමට අමතරව එම වටිනාකමෙන් 25%ක ගාස්තුවක් ද, පරිපාලන වියදමක් ලෙස අයකර ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

(5) ඉහත (2) උපවගන්තිය ප්‍රකාර අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ආපසු ලබාගත් හෝ අයකර ගත් ඉඩම, නිවාස, ද්‍රව්‍ය හෝ මුදල සුදුසුකම් ඇති වෙනත් ප්‍රතිලාභියෙකු වෙත කොමසාරිස්වරයා විසින් ලබාදීම නීත්‍යානුකූල වන්නේය.

(6) ඉහත (2) උපවගන්තිය ප්‍රකාර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් අයකර දෙනු ලබන සියලු මුදල් නිවාස සංවර්ධන ගිණුමට බැර කළ යුතුය.

## III වැනි කොටස

### *පොදු විධිවිධාන*

13. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කිසියම් ඉඩමක් හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයක් හෝ අවශ්‍ය වන්නේ නම් එකී ඉඩම හෝ සම්බන්ධතාවය (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ ඌව පළාතේ පළාත් සභාව වෙනුවෙන් රජය විසින් අත්කර ගනු ලැබිය හැකිය. දේපළ අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත ඇතුලත වූ යම් රජයේ ඉඩමක් අවශ්‍ය වන අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ II වැනි පරිශිෂ්ටයේ 1.1:2 වගන්තිය ප්‍රකාරව පියවර ගනු ලැබිය යුතුය.

(3) ඉඩම් අත්කර ගැනීම හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය ගණනය කිරීමේදී (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව වන්දි ගෙවනු ලැබිය යුතු අතර ඒ සඳහා යන වියදම පළාත් සභා අරමුදලෙන් දැරිය යුතුය.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා හඳුනාගත් විට අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ද, පළාත් සභාවේ ද, ආණ්ඩුකාරවරයාගේ ද අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව එකී ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යය ආරම්භ කළ යුතු වන්නේය.

(5) ඉහත (1) හෝ (2) උපවගන්ති යටතේ අත්පත් කර ගන්නා ලද ඉඩමක් නිවාස සංවර්ධන කාර්යයකින් බැහැර වූ වෙනත් කිසියම් කාර්යයක් සඳහා යොදා නොගත යුතුය.

14. (1) ඉඩමක් හෝ නිවසක් මෙම ප්‍රඥප්තියේ ප්‍රකාරව කිසියම් ප්‍රතිලාභියෙක් වෙත බැහැර කිරීමේ දී, එම දේපළෙහි වටිනාකම ප්‍රතිලාභියා විසින් පළාත් සභාව වෙත, කොමසාරිස්වරයා විසින් දැනුම් දෙන ආකාරයකට වාරික වශයෙන් හෝ එකවර හෝ ගෙවිය යුතුයි. දේපළ බැහැර කිරීම

(2) ඉහත (1) උප වගන්තිය යටතේ බැහැර කරන ලද දේපළෙහි සම්පූර්ණ වටිනාකම ආපසු අයකර ගැනීමෙන් අනතුරුව එම දේපළ වෙනුවෙන් නොතාරිස් ඔප්පුවක් ලියා අත්සන් කර දීමෙන් එහි අයිතිය පවරා දීමට කොමසාරිස්වරයාට හැකිවිය යුතුය.

(3) ඉහත (2) උපවගන්තිය යටතේ ඉඩමක් බැහැර කිරීම සිදුකළ යුත්තේ එහි නිවාසයක් ඉදිකර අවසන් වීමෙන් අනතුරුව පමණි.

15. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය හා කර්තව්‍ය ඉටුකර ගැනීම පිණිසත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, එහි කටයුතු විධිමත්ව පරිපාලනය කිරීම සඳහාත් අවශ්‍ය වන්නාවූ සුදුසු හා යෝග්‍ය නියෝග පැනවීම අමාත්‍යවරයා විසින් කළ යුතුය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

(3) *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝග එසේ පළකළ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් පසු දිනෙක සිට බලාත්මක වන්නේ ය.

(4) *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු එම නියෝග පළාත් සභාවේ සම්මත කර ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) ඉහත (4) වැනි උපවගන්තිය යටතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරන ලද නියෝග පළාත් සභාව විසින් සම්මත කරනු නොලැබුවහොත් ඒ බව ද ගැසට් නිවේදනයක් මගින් මහජනතාව වෙත දැන ගැනීමට සැලැස්වීම අමාත්‍යවරයාගේ වගකීමකි.

(6) ඉහත (3) වැනි උපවගන්තියේ සඳහන් ගැසට් නිවේදනය පළකිරීමෙන් පසුව සහ (5) වැනි උපවගන්තියේ සඳහන් දැන්වීම පළකිරීම අතර කාලය තුළ එම නියෝගය යටතේ කරන ලද කිසියම් කාර්යයක් නිත්‍යානුකූල නොවන කාර්යයක් ලෙස නොසැලකිය යුතු ය.

අර්ථ නිරූපනය

16. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"පළාත" යන්නෙන් බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙන් සැදුම්ලත් ඌව පළාත ද, "පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යාංශය" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂය පිළිබඳ කටයුතු කරන අමාත්‍යාංශය ද,

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ද,

"ලේකම්" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

"කොමසාරිස්" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ද,

"දෙපාර්තමේන්තුව" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුව හෝ නිවාස සංවර්ධන කාර්යය ඉටු කිරීමේ අරමුණින් ස්ථාපිත කර ඇති අංශයක් හෝ ඒකකයක් ද,

"ගිණුම" යන්නෙන් ඌව පළාතේ පළාත් නිවාස සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන නිවාස සංවර්ධන අරමුණ ඇතිව ස්ථාපිත කරනු ලැබ ඇති නිවාස සංවර්ධන ගිණුම ද,

"සමිතිය" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස සංවර්ධන කාර්යයන් සඳහා මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පිහිටුවා ඇති නිවාස සංවර්ධන සමිති ද,

අදහස් කෙරේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

17. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වචනාර්ථ හෝ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල වචනාර්ථය හා භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

10-560/2

---

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2003 අංක 03 දරන "ඌව පළාත් ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය" සංශෝධනය කිරීම සඳහා වන සංශෝධිත ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් සංශෝධිත ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්මවා ගිය පසු, මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු ලිඛිතව මා වෙත දැනුම් දිය යුතුය.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
බදුල්ල, රජ වීදියේ,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාතේ "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන 2010 අංක................................ දරන ඌව පළාතේ පළාත් සභාවේ "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තියයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ 2010 අංක............................................ දරන "ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ (සංශෝධිත) ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය

2. 2003 අංක 03 දරන ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ 03 (2) ආ වගන්තියේ "ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා" යන වගන්තිය වෙනුවට "ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හෝ ඔහු විසින් නම් කරන ඔහුගේ නියෝජිතයෙකු" වශයෙන් යන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 03(2) ආ වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ අංක 12 වැනි වගන්තිය ලෙස පහත සඳහන් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ අංක 12 වැනි වගන්තිය ඇතුළත් කිරීම

මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපවත්නේය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

10-495

---

**ජාතික රාජ්‍ය සභාවේ 1983 අංක 32 සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් සමග කියැවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සමිති ඈවර කර අවසන් කිරීම**

පහත සඳහන් සමුපකාර සමිති එම සමිති ඉදිරියෙන් පෙන්වා ඇති දින සිට ඈවර කොට අවසන් කරන ලද බව 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති සංශෝධන පනත සමග කියැවෙන 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) යටතේ මෙයින් දන්වා සිටිමි.

ජේ. එස්. අරුල්රාජ්,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්,
උතුරු පළාත.

| *අනු. අංකය* | *ලියාපදිංචි කළ අංකය* | *සමිතියේ නම* | *ඈවර කරන ලද දිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 01 | JE/107 | සීමාරහිත පුලෝලි සුරුට්ටු දුම්කොළ නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2006.01.26 | යාපනය |
| 02 | J/931 | සීමාරහිත පුදුකමම් එක්සත් ණය දෙන සමිතිය | 2006.01.26 | මන්නාරම |
| 03 | MN/35 | සීමාරහිත මන්නාරම දිස්ත්‍රික් කර්මාන්ත සමුපකාර සමිති සංගමය | 2006.05.10 | මන්නාරම |
| 04 | MN/44 | සීමාසහිත නානට්ටම් විවිධ සේවා සමුපකාර සමිති සංගමය | 2006.05.24 | මන්නාරම |
| 05 | MN/143 | සීමාසහිත මන්නාර් දිස්ත්‍රික් පොල් නිෂ්පාදන සමුපකාර සමිතිය | 2006.06.12 | මන්නාරම |
| 06 | SS/25 | සීමාරහිත එරුකලම්පිඩ්ඩි බාලිකා මහා විද්‍යාලයීය සමුපකාර සමිතිය | 2006.09.21 | මන්නාරම |
| 07 | SS/22 | සීමාරහිත විඩත්තලතිව් මහා විද්‍යාලයීය, සමුපකාර සමිතිය | 2007.03.07 | මන්නාරම |
| 08 | VM/144 | සීමාරහිත කොණ්ඩච්චිකුඩා මොහමදියා එක්සත් ණයදෙන සමිතිය | 2007.06.29 | මන්නාරම |
| 09 | VM/10 | සීමාරහිත මරුතෝන්ඩුවාන් වේලන්කුලම් එක්සත් ණයදෙන සමිතිය | 2007.06.29 | මන්නාරම |
| 10 | VM/133 | සීමාසහිත එරුකලම්පිඩ්ඩ නූන් ණයදෙන සමුපකාර සමිතිය | 2007.07.04 | මන්නාරම |
| 11 | MN/148 | සීමාරහිත මන්නාරම උතුර ඡන්ද කොටසේ සංවර්ධන සමුපකාර සමිතිය | 2007.07.04 | මන්නාරම |
| 12 | MN/51 | සීමාසහිත සින්නපණ්ඩිවිරිච්චාන් විවිධ සේවා සමුපකාර සමිතිය | 2007.09.20 | මන්නාරම |
| 13 | VM/63 | සීමාසහිත එරුකලම්පිඩ්ඩි අමින් ණයදෙන සමුපකාර සමිතිය | 2007.10.09 | මන්නාරම |
| 14 | J/1164 | සීමාරහිත කෝව්ටිකුලම් එක්සත් ණයදෙන සමිතිය | 2008.06.06 | වවුනියාව |
| 15 | J/929 | සීමාරහිත සාලම්බෙයිකුලම් එක්සත් ණයදෙණ සමිතිය | 2008.06.08 | වවුනියාව |
| 16 | V/432 | සීමාරහිත රාසේන්දිරක්කුලම් එක්සත් ණයදෙන සමිතිය | 2008.07.30 | වවුනියාව |
| 17 | VM/62 | සීමාරහිත පුදුකුලම් එකසත් ණයදෙන සමිතිය | 2008.07.30 | වවුනියාව |
| 18 | VM/138 | සීමාසහිත වවුනියා බටහිර විවිධ සේවා සමුපකාර සමිතිය | 2008.12.15 | වවුනියාව |

| අනු. අංකය | ලියාපදිංචි කළ අංකය | සමිතියේ නම | ඈවර කරන ලද දිනය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 19 | VM/28 | සීමාරහිත තවසියාකුලම් එක්සත් ණයදෙන සමිතිය | 2008.12.15 | වවුනියාව |
| 20 | MN/156A | සීමාරහිත එරුකලම්පිඩ්ඩි ගුරුවරුන්ගේ ණයදෙන සමුපකාර සමිතිය | 2009.10.30 | මන්නාරම |
| 21 | J/33 | සීමාරහිත තිරුනෙල්වේලි නැගෙනහිර එක්සත් ණයදෙන සමිතිය | 2009.12.02 | යාපනය |
| 22 | J/1390 | සීමාරහිත අලවෙඩ්ඩි උතුර පුමගල් ණයදෙන සමිතිය | 2004.03.17 | යාපනය |
| 23 | Je/91 | සීමාරහිත කෝවිලාකන්ඩි මධ්‍යම එක්සත් ණයදෙන සමිතිය | 2010.03.08 | යාපනය |

10-496

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.